# ශාසන ඉතිහාසය

## 01 වන පාඩම  බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය.

2020/2021/2022/2023 01 වන ප්‍රශ්නය

- I ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවේ අන්තර්ගතය කෙටි
- II බුදුන් වහන්සේ ධර්මදූත ව්‍යාපාරය මඟින් අපේක්ෂා කළ අරමුණ පැහැදිලි කරන්න.
- III බුදුරජා යෙන් දක්වන්න.
- IV ඍන් වහන්සේ ආරම්භ කළ ධර්මදූත සේවාවසාර්ථක වීම සඳහා උන්වහන්සේ තුළ පැවති ගුණ සමුදාය ඉවහල් වූ ආකාරය පෙන්වා දෙන්න.

[[ 2019/2020 ]] 01 වන ප්‍රශ්නය

- I බුදුන් වහන්සේ විසින් ප්‍රථම ධර්ම දූත පිරිස අමතා කරන ලද ප්‍රකාශය සඳහන් කරන්න.
- II එම ප්‍රකාශය තුළ ඇතුළත්ව ඇතැයි සැළකෙන ධර්මදූත මෙහෙයක තිබිය යුතු මූලික ලක්ෂණ තුනක් සඳහන් කරන්න.
- III අග්‍ර ශ්‍රාවක තනතුරු ලත් භික්ෂූන් වහන්සේලා අට නමක් තනතුරු සහිතව දක්වා, උගතුන්,බුද්ධිමතුන් හා කුසලතා සහිත පුද්ගලයන් ධර්මදූත සේවාවට එක්වීම ශාසන ව්‍යාප්තියට හේතුවූ ආකාරය පැහැදිලි කරන්න.

02 වන ප්‍රශ්නය

- I මගධාධිපති බිම්බිසාර රජුගේ ප්‍රාර්ථනා පහ නම් කරන්න.
- II කොසොල් රාජ්‍ය හා බැඳුණු සම්බුද්ධ ශාසනය පිළිබඳ සිදුවීම් දෙකක් දක්වා, ඉන් එකක් විස්තර කරන්න.
- III “ධර්මදූත සේවාවේ සාර්ථකත්වය, බුද්ධකාලීන සමාජ පසුබිම, රාජානුග්‍රහය, බුදු සසුනේ අන්තර්ගත දාර්ශනික පණිවුඩය යන කරුණු බුද්ධ කාලයේදීම දඹදිව විශාල ප්‍රදේශයක ශාසන ව්‍යාප්තියට හේතු විය”. යන ප්‍රකාශය සනාථ කරන්න.

03 වන ප්‍රශ්නය

- I ඒ ඒ දිශාවල භික්ෂූන් වහන්සේලාට පැවිදි කරවීමට අවසර දුන් පසු පැවිදි කිරීම සඳහා ඉටු කරන ලද මූලික කාර්‍ය තුනක් නම් කරන්න.
- II ‘ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදාව’ හඳුන්වන්න.
- III ශික්ෂා පද පැණවීමේ පදනම හා ඒවායේ අරමුණු පැහැදිලි කර, ශික්ෂා පද වර්ග කර ඇති ආකාරය දක්වන්න.

(2018/2019) 01 වන ප්‍රශ්නය

- I බුද්ධ ශාසනය ආරම්භ වන සමයේ භාරතයේ පැවති සොළොස්මහා ජනපද නම් කර, ඒ අතුරින් රාජාණ්ඩු පැවති ජනපද දෙකක් හා සමූහාණ්ඩු පැවති ජනපදයක් නම් කරන්න.
- II බුදුන් වහන්සේ ප්‍රශ්න විසඳීමට භාවිතා කළ ක්‍රම හතරක් නම් කර, ඒවා කෙටියෙන් හඳුන්වන්න.
- III “ බුදුන් වහන්සේ ඉදිරිපත් කළ දර්ශනය,බුදු දහමින් සමාජ ගැටළුවලට අදාළ විසඳුම් ලැබීම, සුසංවිධිත ධර්මදූත සේවය, රාජානුග්‍රහය, ප්‍රසාදයටපත් උපාසක උපාසිකාවරුන්ගේ අනුග්‍රහය යන කරුණු සම්බුද්ධ ශාසන ව්‍යාප්තියට හේතු විය”. මෙම ප්‍රකාශය කරුණු සහිතව තහවුරු කරන්න.

02 වන ප්‍රශ්නය

I ප්‍රථමයෙන් බුද්ධ ශාසනයට පිවිසි ප්‍රව්‍රජිත ශ්‍රාවක පිරිස නම් කර, එම පිරිස අර්හත්වයට පත්වූයේ කවර සූත්‍ර ධර්මයක් ශ්‍රවණය කිරීමෙන්දැ'යි දක්වන්න.

II "ඒහි භික්ෂු මහණ උපසම්පදාව" යනු කුමක්දැ'යි හඳුන්වා භික්ෂු ශාසනය තුළ සරණාගමන පැවිද්ද ඇතිවීමට හේතු දක්වන්න.

III විනය නීති පැණවීමේ අරමුණු හා ඒවා සංඝ සමාජයේ පැවත්මට උපකාර වූ ආකාරය පැහැදිළි කරන්න.

[[ 2017/2018 ]] 01 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ විසින් ධර්මදූත මෙහෙවර ආරම්භ කරමින් දේශිත සූත්‍ර දේශනාව නම් කර, එය කිනම් ස්ථානයකදී කවර පිරිසකට දෙසන ලද දැයි දක්වා, එහි දැක්වෙන පැවිද්දන් විසින් අත් හළ යුතු අන්ත දෙක හා අනුගමනය කළ යුතු ප්‍රතිපදාව නම් කරන්න.

II බුදු රජාණන් වහන්සේගේ ධර්මදූත මෙහෙයට පදනම වන සමකාලීන දාර්ශනික හා සමාජ ප්‍රවණතාවල සංක්ෂිප්තයක් ප්‍රථම ධර්ම දේශනාවේ ගැබ්වී ඇත.යන ප්‍රකාශය අදාළ සූත්‍ර දේශනාව ඇසුරින් සාධක දක්වමින් තහවුරු කරන්න.

III බුදුරදුන්ගේ ධර්මදූත සේවාව සාර්ථක වීමට හේතුවූ කරුණු පැහැදිළි කරන්න.

02 වන ප්‍රශ්නය

I බුදුන්ගේ ධර්මදූත සේවාවට පසුබිම් වූ භාරතීය සමාජයේ පැවති වර්ණ ධර්ම හා ආශ්‍රම ධර්ම නම් කරන්න.

II බුද්ධ කාලීන භාරතයෙහි තහවුරුව පැවති ආගමික හා සමාජ පිළිගැනීම් සේ සැළකෙන යාග හෝම,උදක ශුද්ධිය, දිසා නමස්කාරය, සති පූජාව,දුෂ්කර ව්‍රත, බ්‍රහ්ම නිර්මාණවාදය යන කරුණු සැකෙවින් හඳුන්වන්න.

III "ආගමික හා සමාජ සංස්ථාගත මිථ්‍යා සංකල්ප නිසා පීඩාවට පත් භාරතීය ජනතාව නිදහස් කරගැනීමට බුදුරදුන් දැරූ ප්‍රයත්නය ධර්මදූත සේවාවේ සටහන්ව ඇත".යන ප්‍රකාශය තහවුරු කරන්න.

03 වන ප්‍රශ්නය

I සම්බුද්ධ ශාසනයේ ප්‍රව්‍රජාවේ විකාශනය පිළිබඳව අවශ්ථා නම් කරන්න.

II ප්‍රථම ආරාම පූජා දෙකක් නම් කර සංචාරක ජීවිතයෙන් ආරාමික ජීවිතයට බෞද්ධ භික්ෂූන් වහන්සේලා පිවිසීම පිළිබඳව කෙටි සටහනක් දක්වන්න.

III ''සංචාරක යුගය, සංචාරක ආරාමික යුගය, ආරාමික යුගයයන අවස්ථා තුනක් යටතේ බෞද්ධ භික්ෂු සමාජය විකාශනය විය''. යන ප්‍රකාශය පැහැදිළි කරන්න.

[[ 2016/2017 ]] 01 වන ප්‍රශ්නය

I ධර්මදූත සේවාව සඳහා අවශ්‍ය වන කුශලතා භික්ෂු- භික්ෂුණී, උපාසක- උපාසිකා යන සිව්වනක් පිරිස තුළම සංවර්ධනය වන තුරු තමන් වහන්සේ පිරිනිවන් නොපානා බව බුදුරජාණන් වහන්සේ මාරයාට වදාළහ. ශාසන ව්‍යාප්තියට ඉවහල් වන ඒ කුශලතා නම් කරන්න.

II ''ධර්ම දූත සේවයේදී අන්‍ය ලබ්ධිකයෝ බුදුරදුන්ටත් ශ්‍රාවකයන්ටත් විවිධ විරෝධතා එල්ල කළහ''. යන ප්‍රකාශය තහවුරු කරන්න.

III බුද්ධ ශාසන ව්‍යාප්තියට අනුග්‍රහ කළ බුද්ධ කාලීන රජවරුන් නම් කර, ඔවුන්ගේ ශාසනික සේවාවන් පැහැදිළි කරන්න.

02 වන ප්‍රශ්නය

I පඨමාභිබෝධියට අයත් මුල් විසි වස තුළ බුද්ධ ශාසනය ව්‍යාප්ත වුණු ජනපද හයක් නම් කරන්න.

II ''මගධය බුද්ධ ශාසන ව්‍යාප්තියෙහිලා සුවිශේෂ කේන්ද්‍රස්ථානයක් විය''. පැහැදිළි කරන්න.

III භාරතයෙහි වූ චිරන්තන 'චෛතිය' කිහිපයක් නම් කර, චිරන්තන ආගමික විශ්වාස කෙරෙහි බුදුන් වහන්සේ දැක්වූ සහනශීලී ආකල්පය ශාසන ව්‍යාප්තියට හේතු වූ ආකාරය විස්තර කරන්න.

03 වන ප්‍රශ්නය

I ඒහි භික්ඛු ප්‍රව්‍රජාව ලද සය නමක් නම් කර, ඒහි භික්ඛු ප්‍රව්‍රජාව ඉල්ලා සිටීමේ ප්‍රකාශයත්, ප්‍රව්‍රජාව ලබා දීමේ ප්‍රකාශයත් සඳහන් කරන්න.

II සංඝ සමාජය ව්‍යාප්ත වීමේදි ප්‍රව්‍රජාව හා උපසම්පදාව පිළිබඳ කාර්‍යයන් වර්ධනය වූ ආකාරය විස්තර කරන්න.

III ''භික්ෂු ජීවිතයේ අරමුණුවලට ප්‍රති විරුද්ධ සිදුවීම් වැළක්වීමට හා පාලනයට විනය නීති පැණවිණි'' යන ප්‍රකාශය පැහැදිළි කරන්න.

[[ 2015/2016 ]] 01 වන ප්‍රශ්නය

I බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය නම් කොට, එය කිනම් නුවරකදී, කිනම් ස්ථානයකදී,කිනම් ශ්‍රාවක පිරිසකට දේශනා කරන ලද දැයි දක්වා,ඔවුනතුරෙන් පළමු දහම් ඇස පහළ වූයේ කවරෙකුටද?එසේ දහම් ඇස පහළ වූ විට බුදුරදුන් කළ ප්‍රකාශය කුමක්ද යන්නදක්වන්න.

II බිම්බිසාර රජතුමාගේ ප්‍රාර්ථනා පහ නම් කොට, එතුමන් විසින් ඉදි කරවූ ආරාමයේ නම සඳහන් කරන්න.

III බුදුරඩුන් ධරම දූතයන් මෙහෙයවූ ආකාරය, උන්වහන්සේගේ මහා කරුණාව හා තාදි ගුණය, උන්වහන්සේගේ සංනිවේදන ක්‍රම, උන් වහන්සේගේ ප්‍රශ්න විසඳීමේ ක්‍රම,මෙන්ම රාජානුග්‍රහය ශාසන ව්‍යාප්තියට උපකාරවිය යන ප්‍රකාශය තහවුරු කරන්න.

## 02 වන ප්‍රශ්නය

I නව ධර්ම දූත සේවාව සඳහා විශේෂඥ තෙරවරුන් යොදවා ගත් බුදුන් වහන්සේ උන්වහන්සේලාට අග තනතුරු ප්‍රධානය කළහ.එවැනි විශේෂඥ තෙරවරුන් හය දෙනෙකු නම් කර, එක් එක තෙරවරු ලත් අග තනතුරු කවරේද''යි දක්වන්න.

II ''බුදුරදුන් තම ධර්මදූත සේවයේදී ආගමික මිථ්‍යා මත බැහැර කිරීම, සංග්‍රහ සංසිඳවීම,දාමරිකයන් දමනය කිරීම,විවිධ පීඩාවන්ගෙන් සමාජය මුදවා ගැනීම වැනි ආගමික,ආර්ථික,දේශපාලනික හා සමාජික ගැටළුවලට විසඳුම් ඉදිරිපත් කළහ''. මේ ප්‍රකාශය සැකෙවින් කරුණු දක්වමින් පැහැදිළි කරන්න.

III ''බුදුරදුන්ගේ ශාසනික මෙහෙවරින් තහවුරු වූ සමානාත්මතා ධර්මය නිසා කුලවාදයෙන් පීඩාවට පත් අයගේ හා කාන්තාවගේ විමුක්තිය සැළසිණි''. යන ප්‍රකාශය විමර්ෂණය කරන්න.

## [[ 2014/2015 ]] 01 වන ප්‍රශ්නය

I ''ඉසිපතන මිගදායේදී ශ්‍රාවකයන් පස් දෙනෙකුට තම ප්‍රථම ධර්ම දේශනය ඉදිරිපත් කරමින් බුදුරජාණන් වහන්සේ තම ශාසනික මෙහෙවර ආරම්භ කළ සේක''. එම දේශනය හා ශ්‍රාවක පිරිස නම් කරන්න.

II එකළ පැවති ග්‍රාම්‍ය වූ හා අනාර්‍ය වූ ජීවන මාර්ග දෙකෙන් බැහැර වන ලෙසත්, පියවර අටකින් යුත් ජීවන මාර්ගයකට පිවිසෙන ලෙසත්, බුදුරජාණන් වහන්සේ එම පිරිසට වදාළ සේක.'' එකී අත්හල යුතු මාර්ග දෙකත්, අනුගමනය කළ යුතු නව ජීවන මාර්ගයේ පියවර අටත් නම් කරන්න.

III තම ශාසනික මෙහෙවර ආරම්භ කරමින් බුදුරදුන් ඉදිරිපත් කළ ප්‍රථම ධර්ම දේශනයෙහි උන්වහන්සේ සියස් ශාසනික මෙහෙවරෙහි මූළික තේමාව ඉදිරිපත් කළහ. යන ප්‍රකාශය එම දේශනය ඇසුරින් කරුණු දක්වමින් තහවුරු කරන්න.

## 02 වන ප්‍රශ්නය

I ''බුදුරජාණන් වහන්සේ අදාළ උපදෙස් දී ප්‍රථම ධර්ම දූත කණ්ඩායම ශාසනික මෙහෙවරට යොමු කළහ''. එම ධර්මදූත කණ්ඩායම නම් කොට ඔවුනට දුන් උපදේශය කෙටියෙන් දක්වන්න.

II බුදුසසුනේ ප්‍රථම ධර්මදූත සේවාවට අදාළ බුදුරදුන්ගේ ශාසනික මෙහෙවර, ධර්මදූත සේවාවේ අරමුණු හා ධර්නදූත මෙහෙවර සිදුකළ ආකාරය විස්තර කරන්න.

III ''බුදුරදුන්ගේ ශාසනික මෙහෙවර චින්තන විප්ලවයකට මග සැළසෙන විවිධ තරාතිරම්වල සාමාජිකයන් ආකර්ෂණය කරගන්නා සුළු ක්‍රියා පිළිවෙළක් විය''. ශාසනයට එක් වූ පිරිස්, ඊට පාදක වූ බුදුරදුන්ගේ මහාකරුණා ආදී පෞරුෂ ලක්ෂණ, උන් වහන්සේ භාවිතා කළ සන්නිවේදන ශිල්ප ක්‍රම ආදිය නිදර්ශණය කරමින් උක්ත ප්‍රකාශය සනාථ කරන්න.

[[ 2013/2014 ]] 01 වන ප්‍රශ්නය

I සමකාලීන බුද්ධිමතුන් බුදුරජාණන් වහන්සේ වටා එක් රැස්වූ ආකාරය කෙටියෙන් දක්වන්න.

II තමන් වහන්සේ වෙත බඹසර හැසිර විමුක්තිය ලත් හැට නමක් භික්ෂූන් අමතා බුදුරජාණන් වහන්සේ කළ අනුශාසනය ඉදිරිපත් කරන්න.

III "බුදුරජාණන් වහන්සේ විසින් ධර්ම දේශනයේදී භාවිතා කළ ක්‍රම හතරක් වේ". එම ක්‍රම හතර කෙටියෙන් පැහැදිළි කරන්න.

02 වන ප්‍රශ්නය

I බුදුසසුනේ දියුණුවට අනුග්‍රහ සැපයූ බුද්ධකාලීන රජවරුන් තිදෙනකු නම් කරන්න.

II ආරම්භක අවධියේදී සංඝ සමාජය වැඩීගිය ආකාරය විස්තර කරන්න.

III " සංඝ සමාජය වැඩී යාමත් සමඟ පැණ නැඟුණු ප්‍රාදේශීය අවශ්‍යතා මත විනය නීති වෙනස් කිරීමට බුදුරජාණන් වහන්සේ යොමු වූහ". නිදසුන් මඟින් පැහැදිළි කරන්න.

[[ 2012/2013 ]] 01 වන ප්‍රශ්නය

I ආත්මවාදය ප්‍රතික්ෂේප කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන් උදෙසා කළ දේශනය හා එහි අන්තර්ගතය කෙටියෙන් දක්වන්න.

II බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහ කරුණාව ප්‍රකට කෙරෙන අවශ්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

III " බුදුන් වහන්සේගේ දේශනා මනෝවිද්‍යානුකූළව මෙන්ම පුද්ගල විවිධතා අනුව ගොඩ නැගී තිබුණි" මේ ප්‍රකාශය සනාථ කරන්න.

02 වන ප්‍රශ්නය

I බුදුසසුනට ඇතුළත් නොකළ යුතු පුද්ගලයන්ගේ ලැයිස්තුවක් මහාවග්ගපාලියේ සඳහන් වේ. ඉන් තිදෙනෙකු නම් කරන්න.

II සාමණේර පැවිද්ද සහ උපසම්පදාව කෙටියෙන් පැහැදිළි කරන්න.

III " විනය නීති පැනවීමේදී බුදුරජාණන් වහන්සේ ප්‍රජාතන්ත්‍ර වාදී අදහස් කෙරෙහි අවධානය යොමු කළහ'. නිදසුන් මඟින් පැහැදිළී කරන්න.

[[ 2011/2012 ]] 01 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ තම මංගල ධර්ම දේශනාවේදී පළමු කොටම අන්තවාදී දෘෂ්ටීන් ප්‍රතික්ෂේප කළහ.ඒවා ලියා දක්වන්න.

II ප්‍රථම භික්ෂූන් වහන්සේලා සැටනම අමතා බුදුරජාණන් වහන්සේ කළ අනුශාසනව දක්වන්න.

III බුද්ධිමතුන් බුදුරජාණන් වහන්සේ වටා එක්රැස්වීම උන්වහන්සේගේ ධර්මදූත මෙහෙය සාර්ථක වීමට හේතු විය. නිදසුන් දෙමින් පැහැදිළි කරන්න.

02 වන ප්‍රශ්නය

I "බුද්ධ කාලීන භාරතයේ සමාජ පදනම වූයේ කුල භේදයයි". මේ පිළිබඳ ඔබේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

II "පංචම" නමින් හැඳින්වූ ජන කොටස නම් කොට ඔවුන්ගේ සමාජ තත්ත්වය සැකෙවින් දක්වන්න.

III බ්‍රාහ්මණයන්ගේ විශේෂ අයිතිවාසිකම් මෙන්ම ඔවුන් ඉදිරිපත් කළ කුල ක්‍රමයද බුදු දහමින් ප්‍රතික්ෂේප වූ අන්දම පහදන්න.

[[ 2010/2011 ]] 01 වන ප්‍රශ්නය

I බුදු දහම ප්‍රචාරය කිරීමේදී බුදුරජාණන් වහන්සේ උපයෝගී කරගත් සන්නිවේදන ක්‍රම දෙකක් නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

II බුද්ධ කාලීන භික්ෂු සමාජයේ ආරම්භය සැකෙවින් දක්වන්න.

III බුදු රජාණන් වහන්සේ තුළ පැවති ආගමික සහනශීලී බව සහ චෛතිය ස්ථානවලට ගරු කිරීම බුදු දහමේ සීඝ්‍ර ව්‍යාප්තියට හේතු වූ ආකාරය පැහැදිළි කරන්න.

02 වන ප්‍රශ්නය

I බෞද්ධ භික්ෂුව සංචාරක දිවියෙන් ආරාමික ජීවිතයකට අවතීරණය වූ අයුරු පැහැදිළි කරන්න.

II විනය ශික්ෂා පද පැණවීමේ පදනම සැකෙවින් දක්වන්න.

III ප්‍රාතිමෝක්ෂයේ අඩංගු පහත සඳහන් ශික්ෂා පද සංඛ්‍යාත්මකව ලියා දක්වන්න.
අ] පාරාජිකා ආ] සංඝාදිශේෂ ඉ] සේඛියා ඊ] අධිකරණ සමථ

[[ 2009/2010 ]] 01 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා කරුණා ගුණය ප්‍රකට වන අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

II බුදුරජාණන් වහන්සේ එක් එක් අංශවල විශේෂඥතාවයන් ඇති ශ්‍රාවකයින් හැඳිනගෙන උන්වහන්සේලාට යම් යම් වගකීම් පැවරූහ. තනතුරු ප්‍රදානය කළහ. නිදසුන් තුනක් ඇසුරින් මේ කියමන සනාථ කරන්න.

III බුදුරජාණන් වහන්සේ තුළ පැවති "තාදි ගුණය" හඳුන්වා එම ගුණය බුදුසිරිත ඇසුරින් ප්‍රකටවන අවස්ථා තුනක් උදාහරණ මඟින් ගෙනහැර දක්වන්න.

02 වන ප්‍රශ්නය

I සොළොස් මහා ජනපදවලින් හයක් නම් කරන්න.

II ඒවා අතුරින් රාජාණ්ඩු නම් කර, ඒවායින් දෙකක් හඳුන්වා දෙන්න.

III බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයෙහි ශාසනයේ උන්නතිය සඳහා රජවරුන්ගෙන් ලැබුණු අනුග්‍රහය පහදා දෙන්න.

## 03 වන ප්‍රශ්නය

I බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ පැවති ප්‍රධාන කුල (වර්ණ) නම් කොට පහත්ම කුලයේ කාර්‍යභාරයන් කෙටියෙන් හඳුන්වන්න.

II බුදුදහම කුල භේදය ප්‍රතික්ෂේප කළ ආකාරය පෙන්වා දෙන්න

III බ්‍රාහ්මණ ඉගැන්වීම යටතේ කාන්තාවට හිමිව තිබූ සමාජ තත්ත්වය පහදා දෙන්න.

## [[ 2008/2009 ]] 01 වන ප්‍රශ්නය

I දම්සක් පැවතුම් සූත්‍රයෙහි අන්තර්ගතය සැකෙවින් දක්වන්න.

II පැවිද්දෙක් විසින් අත්හළ යුතු යැයි බුදුරඳුන් විසින් පෙන්වා දෙන ලද අන්ත දෙකෙහි දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ වෙන් වශයෙන් ලියා දක්වන්න.

III දෛනික ජීවිතයේදී මධ්‍යම ප්‍රතිපදාව අනුගමණය කිරීමෙහිලා ඇති ප්‍රායෝගික වටිනාකම අගයිමට ලක් කරන්න.

## 02 වන ප්‍රශ්නය

I ප්‍රශ්න,ගැටළු විශ්ලේෂණයෙහිලා බුදුරඳුන් විසින් අනුගමනය කරන ලද සිව් වැදෑරුම් ක්‍රියා මාර්ග කෙටියෙන් ලියා දක්වන්න.

II සඳහම් පනිවුඩය සීඝ්‍රයෙන් පැතිර යාම කෙරෙහි බුදුරඳුන් තුළ පැවති ගුණමහිමය ඉවහල්වූ ආකාරය විමසීමට ලක් කරන්න.

III පස්වග මහණුන්ගෙන් ආරම්භවූ සංඝ සමාජය සම්බුද්ධ පරිනිර්වාණය තෙක් ක්‍රමයෙන් වර්ධනය වූ අයුරු පෙන්වා දෙන්න.

## [[ 2007/2008 ]] 01 වන ප්‍රශ්නය

I විවිධ උපද්‍රව විපත් සංසිඳවීම කෙරෙහි බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා කාරුණිකත්වය ඉවහල්වූ අන්දම නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

II බුදුරජාණන් වහන්සේ තුළ පැවති ප්‍රඥා මහිමය සමකාලීන බුද්ධිමතුන්ගේ ප්‍රසාදයට හේතු වූ බව නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

III "බුදුන් වහන්සේ නිශ්ශබ්දතාව ප්‍රිය කළ ශස්තෘවරයෙකි." නිදසුන් අවශ්ථා දෙකක් ඇසුරෙන් මෙම ප්‍රකාශය සනාථ කරන්න.

## 02 වන ප්‍රශ්නය

I සංඝ සමාජයේ ආරම්භය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

II මුලදී සංචාරක ජීවන ක්‍රමයකට යොමු වී සිටි භික්ෂු සමාජය ක්‍රමයෙන් ආරාමික ජීවන ක්‍රමයකට යොමුවූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

III විනය නීති පැණවීමෙහිලා බුදුරජාණන් වහන්සේ තුළ පැවති ප්‍රජාතන්ත්‍රවාදී ආකල්පය නිදසුන් ඇසුරෙන් විමසීමට ලක් කරන්න.

[[ 2006/2007 ]] 01 වන ප්‍රශ්නය

I ප්‍රථම ධර්ම දූත පිරිස අමතා බුදුන් වහන්සේ විසින් කරන ලද අනුශාසනය ලියා දක්වන්න.

II එම අනුශාසනයෙහි දක්නට ලැබෙන සංවිධානාත්මක ස්වරූපය හා ආදර්ශවත් නායකත්වය විමර්ෂණයට ලක් කරන්න.

III බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන් වහන්සේලාගේ විශේෂ කුශලතා හැඳිනගෙන යම් යම් වගකීම් පැවරූ අන්දම නිදසුන් දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

02 වන ප්‍රශ්නය

I සොළොස් මහා ජනපද අතුරෙන් රාජාණ්ඩු වශයෙන් ප්‍රකටව පැවති රාජ්‍යන් සතර කෙටියෙන් හඳුන්වන්න.

II බුද්ධ කාලීනව වජ්ජි රාජ්‍යයේ බෞද්ධ ප්‍රබෝධයක් පැවති බවට කරුණු තුනක්වත් ඉදිරිපත් කරන්න.

III බුදුරඳුන් ජීවමානව වැඩ සිටියදී බුදු සසුනේ ව්‍යාප්තිය හා සංරක්ෂණය සඳහා රජවරුන්ගෙන් හා ප්‍රභූන්ගෙන් ලද අනුග්‍රාහය පැහැදිලි කරන්න.

[[ 2005 ]] 01 වන ප්‍රශ්නය

I " සැක දුරු කර ගැනීම සඳහා තමන් වහන්සේ වෙත පැමිණෙන පුද්ගලයන්ට බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළ ක්‍රම හතරකි." එම හතර නම් කොට කෙටියෙන් හඳුන්වන්න.

II ධර්මය දේශනා කිරීම සඳහා බුදුන් වහන්සේ විසින් 'මාගධී' භාෂාව තෝරා ගැනීමට බලපෑ හේතු සධාක සාකච්ඡා කරන්න.

III පුද්ගලයාගේ ජීවිතය හා සම්බන්ධ වෘත්තීමය සහ පාරිසරික අත්දැකීම්ද පදනම් කරගනිමින් හා විවිධ දේශනා මාධ්‍ය භාවිතා කරමින් බුදුරජාණන් වහන්සේ ධර්මය විස්තර කරදුන් ආකාරය පැහැදිලි කරන්න.

04 වන ප්‍රශ්නය

I "බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලා උදෙසා දේශනාකොට වදාළ ශික්ෂණ මාර්ගය 'ත්‍රිවිධ ශික්ෂා' නමින් හැඳින්වේ." එම ත්‍රිවිධ ශික්ෂා නම් කර කෙටියෙන් හඳුන්වන්න.

II උභය ප්‍රාතිමෝක්ෂය නම් කොට සප්ත ආපත්තිස්කන්ධයන් විස්තර කරන්න.

III " මුල් විසිවසරක කාලය තුළ ශික්ෂාපද පැණවීමක් අවශ්‍ය නොවූවද භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාත්මකව වැඩිවත්ම ශික්ෂාපද පැණවීමට සිදු විය." මේ කියමන හේතු සාධක සහිතව පරීක්ෂා කරන්න.

[[[ 2004 ]]] 02 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ ධර්ම දූතයන් වහන්සේලා හැට නම අමතා දුන් උපදේශය උපුටා දක්වා, ධර්ම දූත සේවාවේ මූලික අරමුණ එම ප්‍රකාශය තුළ ගැබ්වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

II “බෞද්ධ ධර්ම දූත පිරිස විවිධ කුශලතාවයන්ගෙන් පරිපූර්ණ පිරිසක් වීම එම ධර්ම දූත සේවාවේ සාර්ථකත්වයට රුකුළක් විය.” යන කියමන පරීක්ෂාවට ලක් කරන්න.

III බුදුරජාණන් වහන්සේට පිරිණිවන් පාන්නට මාරයා කළ ඇරයුමට උන්වහන්සේ දුන් පිළිතුර උපුටා දක්වා, එම ප්‍රකාශයේ දැක්වෙන කුශලතා බෞද්ධ භික්ෂූන් වහන්සේලා තුළ සංවර්ධනයවී තිබූ ආකාරය පැහැදිලි කරන්න.

[[[ 2003 ]]] 01 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ ආරම්භ කළ ධර්ම දූත සේවාව සාර්ථක වීම සඳහා උන්වහන්සේ තුළ පැවති ගුණ සමුදාය හේතුවූ අයුරු සමකාලීන ඇගයීම් ඇසුරෙන් විමසන්න.

II ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරදුන් තම ශ්‍රාවකයින් තුළ පැවති විශේෂ දක්ෂතා හඳුනාගෙන අගය කළ බවට කරුණු ඉදිරිපත් කරන්න.

III සමකාලීන සමාජය බුදුරදුන් ඉදිරිපත් කළ ධර්මය සුවිශේෂ වශයෙන් අගය කර ඇති අන්දම දහම් ගුණ ඇසුරෙන් විමසීමට ලක් කරන්න.

02 වන ප්‍රශ්නය

I බුදුන් වහන්සේගේ දහම් පණිවුඩය ශීඝ්‍රයෙන් පැතිර යාමට අන්‍ය සාමයිකයන්ගෙන් අභියෝග එල්ලවූ ආකාරය පැහැදිලි කරන්න.

II සැකදුරු කර ගැනීම සඳහා එන පුද්ගලයින් සඳහා බුදුරදුන් අනුගමණය කළ ක්‍රම හතරක් පිළිබඳව පෙළෙහි සඳහන්වේ. එම සිව් වැදෑරුම් ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

III “බුදුරජාණන් වහන්සේ අනුගමණය කළ දේශනා පර්‍යායන්,මනෝවිද්‍යානුකූලය,එමෙන්ම ඒවා පුද්ගල විවිධතා සලකා ගොඩනංවා තිබුණි.” මෙම ප්‍රකාශය නිදසුන් ඇසුරෙන් සනාථ කරන්න.

[[[ 2002 ]]] 01 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කළ අන්දම කෙටියෙන් පැහැදිලි කරන්න.

II සත්සතිය ගත කිරීමෙන් අනතුරුව බුදුරජාණන් වහන්සේ කුමන කාර්‍යයක් සඳහා සිත යොමු කළේද? යන්න හා එම කාර්‍ය කෙසේ සිදුවේද? යන්න පිළිබඳ විමසීමක් කරන්න.

III බුදුරජාණන් වහන්සේ තම ප්‍රථම ධර්ම දේශනාව සඳහා පස්වග තවුසන් තෝරා ගැනීමට හේතුවූ කරුණු පිළිබඳ විමසීමක් කර, ඉන් ගත හැකි ආදර්ශ මතු කර දක්වන්න.

02 වන ප්‍රශ්නය

I පැරණී භාරතීය සොළොස් මහා ජනපද නම් කොට එයින් රාජාණ්ඩු ගණයට ඇතුළත් රාජ්‍ය හතර වෙන් කර දක්වන්න.

II බුදුරදුන් දවස බුදුසසුනේ ආරාක්ෂාව සහ ව්‍යාප්තිය සඳහා රජවරුන්ගෙන් හා ප්‍රභූන්ගෙන් අනුග්‍රහය ලද අයුරු නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

III “ බුදුරජානණන් වහන්සේ සමකාලීන දඹදිව පැවති විශ්වාස හා සිරිත්විරිත් ආදිය මුළුමණින්ම ප්‍රතික්ෂේප නොකළ අතර නව අරුත් දෙමින් විමර්ෂණයට ලක් කළහ.” මේ අදහස විමසීමට ලක් කරන්න.

[[[ 2001 ]]] 01 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්මදූත පිරිස අමතා කළ ප්‍රකාශය කුමක්දැයි ලියන්න.

II දම්සක් පැවතුම් සූත්‍රයෙහි ඇතුළත් කරුණු කෙටියෙන් ලියා දක්වන්න.

III "ප්‍රථම ධර්ම දේශනාව සඳහා සිත් යොමුකළ බුදුරජාණන් වහන්සේ මිනිස් සමාජය පියුම් පොකුණක් සේ දුටහ. මෙහි දැක්වෙන පියුම් පොකුණේ උපමාවෙන් අපේ ජීවිතයට ගත හැකි ආදර්ශ මතුකර දක්වන්න.

02 වන ප්‍රශ්නය

I යම් යම් විෂය ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥයින් වශයෙන් බුදුරජාණන් වහන්සේ හඳුනාගත් ශ්‍රාවකයින් සිව්දෙනෙකු නම් කරන්න.

II සමකාලීන පඬිවරුන් සමඟ බුදුරදුන් සාකච්ඡාවල යෙදුණු බවට සාක්ෂි තිබේ. නිදසුන් දෙකක් ඇසුරෙන් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.

III බුදුරජාණන් වහන්සේ අනුගමණය කළ දේශනා ක්‍රම බුද්ධ ධර්මයේ ව්‍යාප්තිය සඳහා ඉවහල්වූ බවට නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

[[[ 2000 ]]] 01 වන ප්‍රශ්නය

I ප්‍රථම ධර්ම දූත පිරිස අමතා බුදුජාණන් වහන්සේ විසින් කළ ප්‍රකාශය කුමක්ද?

II එම ප්‍රකාශය තුළින් උන්වහන්සේ තුළ පැවති කෙබඳු ගුණයන් ප්‍රකට වේද?

III "බුදුරජාණන් වහන්සේ විසින් ආරම්භ කරන ලද ධර්ම දූත සේවය සාර්ථකවීම සඳහා බලපෑ හේතු හතරක් පැහැදිලි කරන්න.

02 වන ප්‍රශ්නය

I පස්වග තවුසන්ගේ පැවිදි වීමේ සිට ක්‍රමයෙන් බෞද්ධ සංඝ සමාජය වැඩීගිය අයුරු සැකෙවින් දක්වන්න.

II සංචාරක ජීවිතයෙන් ආරාමික ජීවිතය දක්වා පැවිදි ජීවිතය වර්ධනය වීමත් සමග ඇතිවූ විශේෂතා පැහැදිලි කරන්න.

III බුදු සස්නේ ව්‍යාප්තිය සඳහා කෝසල හා මගධ රාජ්‍ය පාලකයන්ගෙන් ලැබුණු අනුග්‍රහාය කෙබඳු දැයි පෙන්වා දෙන්න.

[[[ 1999 ]]] 01 වන ප්‍රශ්නය

I දම්සක් පැවතුම් සූත්‍රයේ ඇතුළත් කරුණු සැකෙවින් දක්වන්න.

II පළමු රහතුන් හැට නම ධරමදූත සේවයෙහි යොදවමින් බුදුරදුන් කළ ප්‍රකාශය කුමක්ද?

III ඒ ප්‍රකාශයෙහි ප්‍රතිඵල කෙබඳු වීද?

02 වන ප්‍රශ්නය

I "බුදු රදුන් තුළ පිහිටි ගුණ සමුදාය බුදුසසුන දඹදිව සීඝ්‍රයෙන් ජනප්‍රිය වීමට හේතු වූ කරුණු අතර මුල් තැන ගනී." ඒ මොනවාද?

II බුදුරදුන් දවස ශාසනයේ අභිවෘද්ධිය සඳහා කෝසල මගධ රාජ්‍ය දෙකින් ලැබුණු සාහාය කෙබඳු වේද?

III ශාසනයේ ආරම්භයේ සිට බුද්ධ පරිනිර්වාණය තෙක් භික්ෂු සමාජයේ විකාශය පිළිබඳ විමසීමක් කරන්න.

[[[ 1998 ]]] 01 වන ප්‍රශ්නය

I බුදු පියාණන්ගේ ශාසනික සේවය සඳහා සාහායවූ ගිහි උතුමන් පස් දෙනෙකු නම් කරන්න.

II ඒ අය අතරින් තුන් දෙනෙකුගෙන් සිදුවූ සේවය පැහැදිලි කරන්න.

III බුදු පියාණන් තත්කාලීන භාරතීය සමාජයට සැළැස්සවූ යහපත කෙබඳු වීදැයි සාකච්ඡා කරන්න.

[[[ 1997 ]]] 01 වන ප්‍රශ්නය

එදා දඹදිව පැවති ආගමික හා සාමාජික තත්වයත් බුදුරදුන්ගේ පහළවීමෙන් එහි ඇතිවූ වෙනසත් විමසීමට ලක් කරන්න.

02 වන ප්‍රශ්නය

බුදු සසුනේ ජනප්‍රිය වීමට හේතු වූ කරුණු අතර බුදුරදුන් තුළ පිහිටි උදාර ගුණ සමුදායය ප්‍රධානත්වයෙහිලා සැළකිය හැකිය. ඒ ගුණ පිළිබඳ සටහනක් සපයන්න.

[[[ 1996 ]]] 01 වන ප්‍රශ්නය

බුදුරදුන් දවස ශාසනයේ ව්‍යාප්තිය හා අභිවෘද්ධිය සඳහා කෝසල මගධ රාජ්‍ය දෙකින් කෙබඳු සාහායයක් ලැබුණේදැයි විමසීමක් කරන්න.

02 වන ප්‍රශ්නය

බුදුරදුන් පහළ වීමෙන් තත් කාලීන සමාජයට කවර යහපතක් සිදුවීද? නිදසුන් සහිතව විස්තර කරන්න.

විල්වල ස්ථෝලේ භාමුදුරුවෝ